පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය බාහිර - 2017 දෙසැම්බර්

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය I - (WCCG 1)

<u>ග්‍රීක සාහිත්‍යය සහ සාහිත්‍යය සිද්ධාන්ත</u>

(නව නිර්දේශය)

(කාලය : පැය තුනයි)

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව දොළහකි (12).

---

<u>පළමු</u> ප්‍රශ්නයටත් එක කොටසකින් ප්‍රශ්න <u>දෙක</u> බැගින් තෝරා ගනිමින් තවත් ප්‍රශ්න <u>හතරකටත්</u> පිළිතුරු සපයන්න.

1. පහත සඳහන් උද්ධෘත පාඨ අතරින් ඕනෑම <u>හතරක</u> අවස්ථා සම්බන්ධය දක්වා ඒවායේ අන්තර්ගතය පිළිබඳ විග්‍රහ කරන්න.

(a) No seal of his have I unsealed in these ten years.
Of pleasure found with other men, or any breath
Of scandal: I know no more than how to dip hot steal.

(b) Now my curse on the murderer, whoever he is
A lone man unknown in his crime
Or one among many, let that man drag out
His life in agony, step by painful step

(c) She is something different, something greater – she it is
Who has brought the queen, and me, and this whole house to ruin

(d) I'll tell you what I'll do; I'll let you torture this slave of mine.
And if I'm proved guilty, take me off and kill me.

(e) This however took place long after Xerxes' invasion of Greece, and I must get back to my story.

(f) Such were the events connected to the plague.

(g) I can't help wondering whether it is the virtuous love in my body, which desires such noises and tickling sensations as a sneeze.

**(5 x 4)**

## I කොටස - ග්‍රීක සාහිත්‍යය

2. ඊස්කිලස්ගේ **ඇගමෙම්නොන්** නාට්‍යයේ ඇගමෙම්නොන්ගේ මරණයට දැඩි ආඩම්බර බව (hubris) මූලික වූ ආකාරය සාකච්ඡා කරන්න.

3. සොෆොක්ලීස්ගේ **ඊඩිපස් රජ** නාට්‍යයේ ඊඩිපස් ස්ෆින්ක්ස්ගේ තේරවිල්ල නිරූපණය කරන්නේ කෙසේද? එම නාට්‍යය ඇසුරෙන් පැහැදිලි කරන්න.

4. යුරිපිඩීස්ගේ **හිපොලිටස්** නාට්‍යයේ චරිතයන්ගේ අභිප්‍රේරණය අවබෝධ කරගැනීමෙහි ලා මධ්‍යස්තබව සහ බඹසර බව යන තේමාවල වැදගත්කම පරීක්ෂා කරන්න.

5. ඇරිස්ටොෆනිස්ගේ **ෆ්රොග්** නාට්‍යය කාව්‍ය පිළිබඳව සංගත (හෝ පරිපූර්ණ) දර්ශනයක් හඳුන්වාදෙයි ද? පැහැදිලි කරන්න.

6. ඉතිහාසයට දෙවිවරු සහ දෛවය බලපාන ආකාරය පිළිබඳව හෙරඩෝටස් දරණ මතය **ඉතිහාසය** කෘතිය ඇසුරින් විශ්ලේෂණය කරන්න.

7. තුසිඩිඩීස්ගේ **පෙලපනීසියානු යුද්ධයේ ඉතිහාසය** කෘතියේ කථා (speeches) තුළින් මතුවන ඇතීනියානු ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණ තක්සේරු කරන්න.

8. ප්ලේටෝ **මධුසාදය** කෘතිය අවසානයේ ඩයොටිමා හඳුන්වාදීමේ අරමුණ අගයන්න.

## II කොටස - ග්‍රීක සාහිත්‍යය සිද්ධාන්ත

9. කාව්‍යය පිළිබඳව ප්ලේටෝගේ ආකල්ප සහ ඒවාට අධ්‍යාපනය තුළ ඇති ස්ථානය **ජනරජය** කෘතිය ඇසුරින් පැහැදිලි කරන්න.

10. ඇරිස්ටෝටල්ගේ **පොයටික්ස්** ග්‍රන්ථයෙහි දැක්වෙන පරිදි ශෝකාන්ත නාට්‍යක අඩංගු විය යුතු මූලික ලක්ෂණ සමාලෝචනය කරන්න.

11. "ලොංජයිනස්ගේ **ඔන් ද සබ්ලයිම්** ග්‍රන්ථයට අනුව උදාර වාග් විලාශය උත්කෘෂ්ට භාවයේ තෝතැන්නකි." මෙම කියමන සමඟ ඔබ කෙතෙක් දුරට එකඟ වන්නේද ?

12. ඩිමිට්‍රියස් සහ ශෛලිය පිළිබඳ ඔහුගේ නිරීක්ෂණ විවේචනාත්මකව සාරාංශගත කරන්න.

(20 x 4)

------------------

පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය බාහිර - 2017 දෙසැම්බර්

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය II (WCCG 2)

<u>රෝම සාහිත්‍යය සහ සාහිත්‍යය සිද්ධාන්ත</u>

(නව නිර්දේශය)

(කාලය : පැය තුනයි)

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව දහයකි (10).

---

**<u>පළමු</u> ප්‍රශ්නයටත් එක කොටසකින් අවම වශයෙන් <u>එක</u> ප්‍රශ්නය බැගින් තෝරා ගනිමින් තවත් ප්‍රශ්න <u>හතරකටත්</u> පිළිතුරු සපයන්න.**

01. පහත දැක්වෙන උද්ධෘත පාඨ අතරින් ඕනෑම <u>හතරක</u> අවස්ථා සම්බන්ධය දක්වමින් ඒවායේ අන්තර්ගතය පිළිබඳ විග්‍රහ කරන්න.

(a) Well, for Jupiter's sake who am I, if not Sosia?

(b) Therefore superstition in its turn lies crushed beneath his feet, and we by his triumph are lifted level with the skies.

(c) As with a man scarce propels his boat
Against the stream…

(d) For it was felt that they were being sacrificed to one man's brutality rather than to the national interest.

(e) Dishonest hope is always credulous.

(f) At the site of a friend's tears they weep too.

(5 x 4)

## I කොටස - රෝම සාහිත්‍යය

2. ප්ලෝටස් ගේ **ඇම්ෆිට්‍රියෝන්** නාට්‍යයට අනන්‍යතාවය යන තේමාවේ වැදගත්කම සාකච්ඡා කරන්න.

3. විශ්වයේ ස්වභාවය පිළිබඳව ලුක්‍රිසස්ගේ මූලික සිද්ධාන්ත පැහැදිලි කරන්න.

4. වර්ජිල්ගේ **ජෝජික්ස්** (*Georgics*) කෘතිය උපදේශාත්මක කාව්‍යයක් ලෙස ඔබ සලකන්නේද? හේතු දක්වන්න.

5. (a) ඔගස්ටස් බලවත්වීම <u>**හෝ**</u> (b) රෝමයේ ගින්නට නීරෝගේ සාවද්‍යතාව පිළිබඳව ටැසිටස්ගේ අදහස් **ඇනලස්** කෘතිය ඇසුරින් විමසන්න.

6. සෙනෙකාගේ **තයෙස්ටීස්** නාට්‍යයේ දැකිය හැකි සාහිත්‍යමය සහ දාර්ශනික ලක්ෂණ විශ්ලේෂණය කරන්න.

7. රෝම කාන්තාවන් පිළිබඳව ජුවනල්ගේ අදහස් මොනවාද? ඔබ හදාරා ඇති ජුවනල්ගේ උපහාස රචනා (Satire) ඇසුරින් පිරික්සන්න.

## II කොටස - සාහිත්‍යය සිද්ධාන්ත

8. "**ආර්ස් පොයටිකා** හි හොරස් විසින් කවීන්ට ලබාදෙන උපදේශ විචාරවත් මෙන්ම ප්‍රායෝගිකද වේ. " මෙම කියමන සමඟ ඔබ කෙතෙක් දුරට එකඟ වන්නේද?

09. කථිකත්වය පිළිබඳව සිසෙරෝගේ අදහස් සාකච්ඡා කරන්න.

10. ක්වින්ටිලියන් කථිකයාගේ අධ්‍යාපනය පිළිබඳව කරන නිර්දේශ තක්සේරු කරන්න.

(20 x 4)

--------------------

පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය බාහිර - 2017 දෙසැම්බර්

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය III (WCCG 3)

ග්‍රීක චින්තනය
(නව නිර්දේශය)

(කාලය : පැය තුනයි)

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව නමයකි (9).

---

පළමු ප්‍රශ්නයටත්, එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගනිමින් තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.

01. පහත දැක්වෙන උද්ධෘත පාඨ අතරින් එක් දාර්ශනිකයකුගෙන් අවම වශයෙන් උද්ධෘත පාඨ දෙකක් තෝරා ගනිමින් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වමින් ඒවායේ අන්තර්ගතය පිළිබඳව විග්‍රහ කරන්න.

ප්ලේටෝගේ : ජනරජය **(REPUBLIC)**

(a) But the state of god and the divine is perfect, and therefore God is least liable of all things to be changed into other forms.

(b) But when our men and women get past the age of breeding, then we can leave them free to mate as they please…

(c) So the painter, carpenter and god are each responsible for one kind of bed.

ඇරිස්ටෝටිල් : ආචාරධර්මවාදය **(ETHICS)**

(d) Vice such as is shown by the intemperate man is like dropsy or tuberculosis, whereas incontinence is like dropsy.

(e) So evidently wisdom must be the most finished form of knowledge.

(f) It follows that suicide commits an injustice. But against whom?

(5x4)

## I කොටස - ප්ලේටෝගේ ජනරජය (REPUBLIC)

2. පළමු පරිච්ඡේදයේ ඉදිරිපත් කෙරෙන යුක්තිය පිළිබඳ ග්‍රීක අදහස් සාරාංශගත කරන්න.

3. ආත්මය පිළිබඳව ප්ලේටෝගේ මතය සහ එය පරමාදර්ශී රාජ්‍යයේ සංයුතියට වැදගත්වන ආකාරය පරීක්ෂා කරන්න.

4. ප්ලේටෝට අනුව දාර්ශනික පාලකයා සතු ගුණාංග කවරේද? ඔබ මෙම විශ්ලේෂණය සමඟ එකඟ වන්නේද?

5. ගුහාව පිළිබඳව උපමාව ගෙන හැර දක්වන අර්ථය සහ එය දක්වන ආකාරය විග්‍රහ කරන්න.

## II කොටස - ඇරිස්ටෝට්ල්ගේ ආචාරධර්මවාදය (ETHICS)

6. සතුට මිනිසුන්ට ලදහැකි විශිෂ්ටතම දෙයක් ලෙස සැලකෙන්නේ ඇයි? ග්‍රන්ථය ඇසුරින් හේතු දක්වන්න.

7. වරණය පුද්ගලයකු යුක්තිගරුක හෝ අයුක්තිගරුක කිරීමෙහි ලා දරණ භූමිකාව සාකච්ඡා කරන්න.

8. මධ්‍යන්‍යය පිළිබඳව ඇරිස්ටෝටල්ගේ අදහස් විමසන්න.

9. ආත්මයේ විචාරශීලී කොටස සතු පස් වැදෑරුම් චිත්ත ප්‍රභව සහ ඒවා ප්‍රකාශ කරන ආකාර කවරේද? පැහැදිලි කරන්න.

(20 x 4)

---------------------